සිද්ධි SIDDHI 4

# බල්ලන්ට එරෙහිව බල්ලන් හා මයිකලෑ ගේ කටේ වැරැද්ද




රත්මලාන ගුවන් තොටුපල යාබද ව දැනට කොතලාවල ආරක්ෂක පීඨය එවකට හැඳින්වූයේ **සර් ජෝන් ගේ වත්ත,** නැත්නම් කොතලාවල වත්ත, කඳවල වත්ත යනුවෙනි.

මේ වත්ත බොහෝ අලංකාර කර තැබීමට සෞන්දර්යයට, පරිසරයට ඇළුම්කල සර් ජෝන් මහතා ගත් උත්සාහයන් රසවින්දේ එය නැරඹීමට එන පිරිස් විසිනි. බොක්සිං බැනියමක් හා කාකි පැහැති කොට කලිසමක් හැඳ පැළඳ ඔහු උදෑසන එළිමහන් තේ මේසයට වී පරිසරය රසවිඳින අයුරු මා බොහෝ විට දැක ඇත්තෙමි.

ගෝනුන්, මුවන්, මොනරුන් වැනි නානා මාදිලියේ සතුන්, මාළුන්, පක්ෂීන් ගෙන් ගහණ ව අලංකාර ව පැවතුණු මේ බිමේ බොහොමයක් චිත්‍රපට වල රූප රාමු පවා හසුකර ගැනීමට අධ්‍යක්ෂවරුන්ට මහත් උපකාරයක් විය.

ආදරවන්තයන්ට ද හමුවී කතාබස් කිරීමට පරිසරයක් සර් ජෝන් මහතා ගේ මේ පරිසරයේ විණි. පාසල් කාලයෙන් මිදී නිවාඩු පාඩුව ලැබෙන සෙනසුරාදා දිනෙක මාත් අසල්වාසී මිතුරන් කිහිපදෙනෙක් ද මේ සර් ජෝන් ගේ වත්තේ සිරි නැරඹීම ට ගියෙමු. මා ඔවුන් සමග රැඳී සිටීමේ කාලවේලාව ඉක්ම යන බැවින් ගෙදරයාමේ අවශ්‍යතාවය දන්වා ගෙදර ඒමට ලහි ලහියේ පිටත් වීමි. මන්දයත් පමාවුවහොත් මෙවන් ගමන් ආයේ යන්නට නොදෙනවා පමණක් නොව මිතුරන්ට ද ගෙවල් පැත්ත පලාතේ පස් පාගන්නට නොවන වග මා දන්නා බැවිනි.

කඳවල පාරේ සිට මාගේ ගෙදර දක්වා ඇති මාර්ගය පැය බාගයක තරම් දුර ගමනකි. මා ඇවිදිනවාට වඩා දුවනවා යැයි කීවොත් නිවැරදිය. මෙලෙස මඳක් දුර දුවන්නට වූයේ නැත. තාප්ප බැඳි නිවසක ගේට්ටු පලු අතරින් **"කළු දඩෝරියකු"** එළියට පැන්නේය. සිතන්නට වෙලාවක් නොවේ. මේකාට අසුවුවහොත් මාගේ කටුටිකකවත් ඉතුරුවන්නේ නැත.

එකල මාගේ කෙසඟ සිරුර ට වේගයෙන් දිවීමේ හැකියාව තිබුනා යැයි මට හැඟේ. එනමුත් මේ වසවර්තියා එක්ක මොන දිවිලිද? දඩෝරියා මා ඩැහැගන්න ට මොහොතක්වත් නැත. දුවන අතරේ පාත් වී අතට අසුවූ කොන්ක්‍රීට් ගල් කැබැල්ලක් ගතිමි. මගේ කකුලට දත් පහර ගහන්නට ආසන්න වූ සුනඛයා එකවර ම ආත බූත කඩාගෙන, නගුටත් පිටුපස ගසාගෙන පසු පස නොබලා හැල්මේ දුවන්නට විණි. ගලක් අතට ගත්විට බල්ලකු කොතරම් බියද යන්න දැනුනේ එවිටය. කෙසේ නමුත් මේ වෙලාවේ වූ අකරතැබ්බයෙන් මා ගලවා ගැනීම වෙනුවෙන් දෙවියන්ට පින්දුන්නෙමි.

මා අතැති කොන්ක්‍රීට් කැබැල්ල ලොකු ගල් කැබැල්ලක් නමුත් මේ තරම් සැහැල්ලු මන්දැයි විමතියෙන් බැලීමි. හිරිකිත කමින් ගැස්සුනු මා'තින් ගල් කැබැල්ල ගිළිහුණි. බල්ලා මේ තරම් බියවූයේ ගල් කැබැල්ලකට නොව තවත් බල්ලකු විසින් පැහැරූ මළපහ ගොඩකටය. තද අව්රස්නය නිසා වියලී පැහැය වෙනස් වී තිබූ මෙය දුටුවිට බල්ලා කෙරෙහි තිබූ භීතිය මෙන්ම, එය පරයා සිනහව නැගෙන්නටත් විය.

මේ වුන දේ මා කෙලෙස මිතුරන්ට, ගෙදරට කියන්නදෝ කියා ඒ දවස සිතීමි. බල්ලාට එරෙහිවන්නට බල්ලකු පැහැරූ දේ කොතරම් ප්‍රයෝජනවත් වූවාද යන්න මට අදට ද සිනහා ගෙනදේ.



මිතුරන් කිහිප දෙනෙකු විශ්ව විද්‍යාලයට යන කාලයේ නතරවී සිටියේ එකම බෝඩිමකය. අවසාන වසරේ සිසුන් වූ ඔවුන් සවස් යාමයේ විනෝදය පිණිස කාඩ් ගසන්නට, කැරම් ක්‍රීඩාවේ යෙදෙන්නට පුරුදු ව සිටියාය. එවන් වේලාවක සිකුරාදා දිනෙක සවසක් වේනම් රත්වෙන යමක් ගෙන විනෝදවන්නට අමතක කලේ නැත.

එවන් දිනෙක සුපුරුදු වින්දනය ලබන්නට ඔවුනට නොලැබීම ගැන මේ මිතුරන් පසු තැවෙන්නේ ඊදින පෝය දිනයක් වූ නිසාය. අවට සෑම තැනකම වාගේ බාර් වසලාය. ඇත්තේ එකම උත්සාහයකි. එනම් බෝඩිමට නුදුරින් පිහිටි මයිකල් අයියාගේ ස්පොට් එක පමණකි. එනමුත් මේ ගේ අසල නොගැවසුනු ඔවුන් එවැනි තැනකට යන්නට මැලිකමක් දක්වන්නේ ගමට ආගන්තුක වූ මේ තරුණයන් මයිකල් අයියාගේ ගුබ්බෑයම පැත්තේ කරක් ගහන්නේ මන්දැයි අසල්වාසීන් විමසිලිමත් වන බව දන්නා නිසාවෙනි.

උවමනාවන් ගේ දැඩි ඇවිටිල්ලෙන් ඒ සියල්ල දැවියයි. **"මචං මේ අද කොහෙන්වත් පුතෝ බඩු ගන්න වෙන්නෙ නෑ...මයිකලෑගෙ පිහිට තමයි. කරුවල වැටෙන්න අල්ලා ඒ පැත්තට සෙට් වෙමු. මෑන්ස් නම් අපිව දන්නෙ නෑ...බලමු ට්‍රයි එකක් දීලා.**

**මේ...මේ මම නං ඕවා බීලා නෑ...කමක් නෑ අදට මොනවා හරි කරමුකෝ...**එකෙකු කියයි. අඳිමඳි කරමින් සියල්ලෝම කරුවල වැටෙද්දී දෙවටේ කොනක පිහිටි මයිකල් අයියා ගේ නිවසට සේන්දුවේ.

**මළා...මෑන්ස් ගෙදර නෑ වාගේ...හැම පැත්තෙන්ම දොරවලුත් වහලා...** කීප වරක්ම තට්ටුකලමුත් මයිකල් අයියා ගේ ගෙතුල තුලින් කිසිදු ආමන්ත්‍රණයක් නොවිය. එකෙකු දොරේ හිදැසට ඇස තබා බලනවිට එහි ලාම්පු එළිය දැල්වේ. යමෙකු සිටිනා බවද පෙනේ.
**මචං...මයිකලෑ ඉන්නවා...මෑන්ස් දොර අරින්නෙ නෑ. සමහරවිට අපේ සිග්නල් එක වැරදි ඇති.**

පෝයදාට මෙතෙන්ට එන අය දන්නවා ඇති කොහොමද තට්ටුව දාන්න ඕනෙ කියලා. කරන්න දෙයක් නෑ. යමු යන්න. සියල්ලෝම සුන්වූ බලාපොරොත්තුවෙන් සුපුරුදු බෝඩිම වෙත පියනගයි.
**"අඩේ මට මතක්උනා නියම අයිඩියා එකක්...යමං ගෙදර ගිහින් අපේ රග්බි බූට්ස් ටික දාගෙන එමු...**එකෙකු ගේ අදහස ක්‍රියාත්මක වේ.

**රග්බි බූට්ස් දැම්මා කියලා මොන කෙංගෙඩියක් කොරන්නද බං...**
**...මේ මචෝ...මං කියාපු විදිහට වැඩ කරපන්කෝ...බඩු ෂුවර්...**

මෙවර ඔවුන් බෝඩිමට ගොස් රග්බි බූට්ස් ද පැළඳ ආයේ කරුවලේ ම මයිකල් ගේ ගෙදරට පැමිණේ. මෙවර එන්නේ පොළවට බර අඩි තබමිනි. බොරළු පොළවේ **සරස්...බරස්** යන හඬ අවට ට ඇසේ. ඒ හඬ හමුදා නිලධරයන් ගේ ගමනට සමාන හඬකි.

මයිකල් ගේ ගෙදරට ආ පිරිස උස් හඬින් කෑගසයි.
**"ඒයි මයිකල් දොරඅරිනවා...අපි පොලීසියෙන්..**දොරට වැරෙන් පහර දෙයි.
මයිකල් ගේ හඬ ක්‍රියාත්මක වේ.
**පොලීසියෙන්...මම බයවෙයි පොලීසියට**
**"මේ... දැන් එක පාරකුත් ආවා නේද...යනවා මහත්තයා යන්න පවු නෝදී...මෙහෙ බඩු නෑ ඕයි...**

**මයිකල් පොලිසිය එක්ක සෙල්ලං කරන්න එන්න එපා...**
දෙතුන්දෙනා ගර්ජනාත්මකව හඬ නගයි.

**මම දැන් එක සැරයක් කිව්වා උඹලට...මන්නා පාර දෙන්නේ හිටු උඹෙ අ...**
ඒ වචනය ඇසෙනවාත් සමගම ආපු කාරණයද අමතක වූ මිතුරන් එක හුස්මට දිව ගියේ බෝඩිම වෙතය.

**"මචං ඒකා බය කරලා දොර ඇරගන්න බැලුවේ. පස්සේ පොඞ් විහිළුවක් කරාය කියලා වැඩේ ෂේප් කරගන්න. කොහෙද...ඕන් මේ නරුමයා අපේ මවු පාර්ශවයත් මතක් කරන්නේ ආවේ.**

මිතුරන් ගේ මතට මොහොතකට තිත තබන්නට මයිකල් සමත් විණි. කාලය ගෙවී යයි.
නැවත වරක් මයිකල් ගේ නිවසේ දොරට පිරිසක් තඩිබානු ඇසේ. **සරස්..බරස්** ගගා ගේ අවට ඇවිදින හඬ මයිකල් ගේ කේන්තිය යලි යලි අවුස්සයි.

**මයිකල්...ඇරපන් දොර අපි පොලීසියෙන්...**යලිත් තර්ජනාත්මක ව එකෙකු හඬ නගයි.
**අනේ පලයන් බං යන්න අපි නොදන්න පොලීසිය...කව්ද ඩෝ පොලිසිය කෙයාර් කරන්නේ මේ මයිකල්...**

**මයිකල් දොර ඇරපන් කිව්වා....**

**මේ...ඕයි පොලීසිය ලොකු කෙරුමෝ නම් එන්න ඕනේ දොර ඇරගෙන...අද නම් මන්නා පාර දෙන්නේ ඔලු පැලෙන්න.** මයිකල් මහ හඬින් කෑගසයි.

වෙර යොදා ගසනා පා පහරකින් මයිකල් ගේ නිවසේ දොර සුළඟේ පාවී ගොස් මයිකල් වත් පෙරලාගෙන මහ හඬ දී බිම වැටේ. ඒ මොහොතේ මයිකල් ගේ නිවසින් ඇසෙන්නේ හට්ටි මුට්ටි හැලි වළං, බැරල් පෙරලෙන ශබ්දයත්." **අම්මෝ ඇති බුදු මහත්තයෝ...**යන දෝංකාරය පමණකි.
පසුදා සවස, පෙරදා මත සෙවූ සගයින් රාත්‍රී ආහාරය ගැනීම සඳහා මයිකල් ගේ නිවස අසලින් පියමං කරයි.

**"ඒයි මයිකලෑ ගෙදර දෙතුන් දෙනෙක් මිදුලෙ ඉන්නවා. මෑන්ගෙ හැම තැනම බැන්ඩේජ් කරලා. ආන්...එකෙක් ඇඟත් තවනවා.**

තවත් මොහොතකදී ඒ අසලින් ගමන් ගන්නා පුද්ගලයකු ගෙන් ඔවුන් කරුණු විමසුවේය. ඔවුනට දාඩිය නැගුනේ ඔහු කී කතාව අසලාය.

**"දන්නේ නැද්ද මහත්තෙයෑලා...ඊයේ රෑ පොලිසියෙන් පැනලා බඩු අල්ලන්න...මිනිහා පොලීසියට කුණු කතාවෙන් බැනලා...ඒ විතරක් යැ සෑහෙන්න සීල් එහෙමත් තිබිලා...කියන විදියට දත් දෙක තුනකුත් කැඩෙන්න අම්බානටම නෙළලා...අමාරුවෙන් තමයි ඔය කළු මහත්තයා ගිහින් ඇප දීලා ගෙනත් තියෙන්නේ...**

මේ කතාව අවසානයේදී මෙයට දායක වූ පිරිස ඔවුනගේ බාසාවෙන් කියා සිටින්නේ මීවිත තොලගෑමේ අවශ්‍යතාව මත කල රගපෑමක් නිසා දෙපිරිස වරද්දා ගෙන පමණට වැඩියෙන් ගොස් මයිකල් අයියා පොලිසියෙන් ඉල්ලා ගෙනම කා ඇති බවකි.

